# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
# கமநல அபிவிருத்தித் திணைக்களம்
# DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/13/AD/1(V4)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019-03

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
වැඩසටහන් හා අධීක්ෂණ අංශය
18 MAR 2019
කොළඹ 07.

චක්‍රලේඛ අංක - 04 / 2019

සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන

නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන් වෙත,

**05/2018,06/2018,07/2018,10/2018,26/2018 චක්‍රලේඛ උපදෙස්වලට අනුව කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.**

ඉහත සඳහන් චක්‍රලේඛ උපදෙස්වලට අනුව 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ඇතැම් ගොවි සංවිධාන, ගොවිජන සේවා කාරක සභාව මෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන් තම පෞද්ගලික අභිමතයට අනුව ක්‍රියා කරමින් කුඹුරු ඉඩම්හිමි අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අයුරින් ක්‍රියා කරන බවට ප්‍රධාන කාර්යාලය වෙත පැමිණිලි ලැබෙමින් පවතී.

02. මෙය සතුටුදායක තත්වයක් නොවන අතර,මෙවැනි අකටයුතු සිදුවීම් වැලැක්වීම සඳහා ක්‍රියා කිරීම අප සතු වගකීමක් වනු ඇත. මෙවැනි සිදුවීම් වැලැක්වීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් මෙයින් දැනුම් දෙමි.

I. තම කුඹුරු ඉඩම සම්බන්ධයෙන් ඉහත සඳහන් චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී තමාට අසාධාරණයක් වූ බවට යම් තැනැත්තකු චෝදනා කරනු අවස්ථාවකදී හෝ එසේ අසාධාරණයක් සිදු වී ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බව ඔබට පෙනී යන අවස්ථාවලදී,
ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කළ යුතුය.

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්

ප්‍රාදේශීය ඉංජිනේරු/දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී හෝ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර

ජ්‍යෙෂ්ඨ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී (දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත) හෝ එම ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු

II. ඔබ කණ්ඩායම විසින් පෞද්ගලිකව පරීක්ෂා කිරීමෙන් අනතුරුව අයදුම්කරුගේ ඉල්ලීම පිළිගත හැකි බවට ඒකමතිකව තීරණය කරන්නේ නම් පමණක් අමුණුම -1 (DAD/PL/19/01)ආකෘතියට අනුව කණ්ඩායමේ තම නිර්දේශය හා අදාළ අයදුම් පත්‍රය ඉදිරි කටයුතු සඳහා මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ. பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, NO. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX 537, COLOMBO 07.
දුරකථන/தொலைபேசிகள்/Telephones :
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060
ෆැක්ස් / தொலை நகல் / Fax: 2693572, 2691843, 2674481
E-mail : commissionerdad@yahoo.com
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

III. යම් හෙයකින් අයදුම්කරුගේ ඉල්ලීම ඔබ කණ්ඩායම විසින් ඒකමතිකව නිර්දේශ නොකරන්නේ නම්, ඔබ කාණ්ඩායම් තීරණය මා හට ද පිටපතක් සහිතව අයදුම්කරු වෙත ලිඛිතව දැනුම් දීමට ක්‍රියා කළ යුතු වේ.

IV. එසේ අයදුම්කරු විසින් මෙවැනි පැමිණිල්ලක් ඉදිරිපත් කර මසක් ඇතුලත (දින 30 ක්) අදාළ කුඹුර පරීක්ෂා කර බලා ඔබ කණ්ඩායම් නිර්දේශය ලබා දීමට ක්‍රියා කළ යුතු බවත් වැඩිදුරටත් දැනුම් දෙමි.

V. යෝජිත කරුණ සම්බන්ධයෙන් තීරණය ලබා දීමට අදාළ සංකීර්ණ තාක්ෂණික ගැටලු පවතින අවස්ථාවලදී, ඊට අදාළ තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා, අදාළ තාක්ෂණික ගැටලුව ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු (ජල කළමනාකරණ) වෙත යොමු කරන මෙන් ද වැඩිදුරටත් උපදෙස් දෙමි. (උදා:-පාංශු ගැටලු, රක්ෂිත පිළිබඳ ගැටලු ආදී)

03. මෙරටේ සියලු කෘෂිකාර්මික ඉඩම්වල ප්‍රශස්ථ ඵලදායිතාවයක් පවත්වා ගැනීම සඳහා වඩාත් කාර්යක්ෂම සහ සාධාරණ වූ සේවාවක් සැපයීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ රාජකාරිය වන බැවින් ඔබ ඇතුළු මෙම දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලය ඉහත කරුණු සම්බන්ධයෙන් වඩාත් කාර්යක්ෂමව හා සංවේදීව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත

| | | |
|---|---|---|
| 01. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | - කා.දැ.ග.ස. |
| 02. | සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත | - කා.දැ.ග.ස. |
| 03. | අති. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | - කා.දැ.ග.ස. |
| 04. | ප්‍රධාන කාර්යාලයේ සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් වෙත | - කා.දැ.ග.ස. |
| 05. | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු වෙත | - කා.දැ.ග.ස.අ.ක.ස. |

162

ඇමුණුම - 01ආකෘතිය

| DAD | PL | 19 | 01 |
|---|---|---|---|

* 1 ...................................... චක්‍රලේඛ උපදෙස්වලට අනුව කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව

1. ඉඩමේ පිහිටීම

1.1 දිස්ත්‍රික්කය :

1.2 ප්‍රා.ලේ. කොට්ඨාශය :

1.3 ගොවිජන සේවා බල ප්‍රදේශය :

1.4 කෘ.ප.නි.ස. කොට්ඨාශය :

1.5 ග්‍රා.නි. කොට්ඨාශය :

2. කුඹුරු ඉඩමට අදාළ තොරතුරු

2.1 කුඹුරේ නම :

2.2 බිම් ප්‍රමාණය: අ. ............රූ: ............පර්. ................. :

2.3 පිඹුරේ අංකය : කැබලි අංකය: පිළියෙළ කළ දිනය:

2.4 පිඹුර පිළියෙළ කළ බලයලත් මිනින්දෝරුතැනගේ නම :

2.5 වර්තමාන කුඹුරු නාම ලේඛනයේ සඳහන් වේද? (√) : ඔව් ☐ නැත ☐

2.6 ඔව් නම් : පොත් අංකය: පිටු අංකය: තීරු අංකය:

3. ඉඩම් හිමියා පිළිබඳ තොරතුරු

3.1 නම :

3.2 ලිපිනය :

3.3 ජාතික හැඳුනුම්පත් අංකය:

3.4 දුරකථන අංකය:

4. නිරීක්ෂණ

4.1 ඉඩම පරීක්ෂා කළ දිනය :

4.2 ඉඩමේ වර්තමාන වර්ගීකරණය:

වගා කරන කුඹුරක් *2 ............. වර්ගයේ පුරන් කුඹුරක් ☐ කුඹුරු ඉඩමක් නොවේ. ☐

4.3 වර්තමාන ඉඩම් භාවිත :

වී වගා කර ඇත ☐ පුරන් කුඹුරකි ☐ කෘෂිකාර්මික ගොඩ ඉඩම/ගෙවත්ත ☐

ව්‍යාපාර භාවිත ☐ අර්ධ වාර්ෂික බෝග වගා කර ඇත ☐ ස්ථිර බෝග වගා කර ඇත ☐

වෙනත් ........................................................................ (සඳහන් කරන්න)

5. සඳහන් කළ යුතු විශේෂ කරුණු

I.

II.

III.

6. ඉහත නිරීක්ෂණ අනුව, අයදුම්කරුගේ ඉල්ලීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව නිර්දේශ කිරීමට තීරණය කරන ලදී.

කොන්දේසි

I.

II.

III.

| | | |
|---|---|---|
| ..................................................... | ................................. | ................................. |
| ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් | ප්‍රාදේශීය ඉංජිනේරු/ දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී/ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර | මූලස්ථාන ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී/ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නියෝජිතයෙකු |
| දිනය: | දිනය: | දිනය: |

---

*1 05/2018,06/2018,07/2018,10/2018,26/2018 චක්‍රලේඛ අතරින් අදාළ චක්‍රලේඛයේ අංකය පමණක් සඳහන් කරන්න

*2 අදාළ වර්ගීකරණය සඳහන් කරන්න

A වර්ගය - නැවත වී වගා කළ යුතු

B වර්ගය - වී වෙනුවට වෙනත් බෝග වගා කළ හැකි (වෙනත් කෘෂිකාර්මික නොවන භාවිතය සඳහා 07/2018 චක්‍රලේඛය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.)

C වර්ගය - $C_1$ – නැවත වී වගාවට යොමු කළ යුතුය.

$C_2$ - කෘෂිකාර්මික (කුඹුරු) ලේඛනයෙන් ඉවත් කර කෘෂිකාර්මික (ගොඩ) නාම ලේඛනයට ඇතුලත් කළ යුතුය.

$C_3$ –කෘෂිකාර්මික (කුඹුරු) ලේඛනයෙන් ඉවත් කළ යුතුය.

$C_4$ -පරිසර වශයෙන් සංවේදී බැවින්, සංරක්ෂණය සඳහා අදාළ රාජ්‍ය ආයතනය වෙත බාර දිය යුතුය.